## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - 2014

-----------------------------------------------

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණන සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය රු.15,700,000 ක් වටිනා වාහන දෙකක් ඒවායේ අයිතියද මාරු කර සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කර තිබුණි. කෙසේ වුවද මෙම වාහනවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි මධ්‍යස්ථානය හා වෘත්තිය ඉගෙනුම් ඒකකය (CEDPL) හා පශ්චාත් උපාධි ඒකක (PU) විසින් බාහිර උපාධි පාඨමාලා හා ශාස්ත්‍රපති උපාධි පැවැත්වීම මඟින් සමාලෝචිත වර්ෂය තුළ රු.2,005,793 ක ශුද්ධ ආදායමක් උපයා තිබුණි. කෙසේ වුවද එම ඒකකවල ගනුදෙනු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් අලුත්වැඩියා කළ නොහැකි විෂයයන් වෙන්දේසියක් මඟින් විකුණා තිබුණි. එසේ වුවද එම විෂයයන් සඳහා ඉල්ලුම් කළ පුද්ගලයන්ගෙන් ලැබිය යුතු රු.125,350 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ජීව විද්‍යා දෙපාර්තමේන්තුවේ රු.816,670 ක් වටිනා පාරිභෝජ්‍ය විෂයයන් හා රසායනික ද්‍රව්‍ය තොග ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) නිමකරන ලද හා විශ්වවිද්‍යාලයට භාර දෙන ලද ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත්‍ර සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුට රු.23,567,604 ක මුදලක් විශ්වවිද්‍යාලයට ගෙවීමට සිදු වී තිබුණි. කෙසේ වුවද මෙම මුදල වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සේවය හැර ගිය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකුට අදාළව එකතුව රු.843,123 ක් වූ සේවක ණය ශේෂයන් වර්ෂ 03 සිට 15 දක්වා කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද මෙම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 2015 අප්‍රේල් 30 විගණන දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (i) X පරිච්ඡේදයේ 23 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබාගන්නා ලද නිවාඩු සම්බන්ධයෙන් නිවාඩු ලේඛන විශ්වවිද්‍යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු පිළිබඳ අංක 96 ආකෘති පත්‍රය මඟින් විගණකාධිපතිවරයාට මාසිකව වාර්තා කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) අංක 102-104 | (i) විශ්වවිද්‍යාලයට අයත් වාහන 05 ක් අනතුරුවලට භාජනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.2,699,793 ක් වැයකර ඒවා අලුත්වැඩියා කර තිබුණි. කෙසේ වුවද ඒවායේ ප්‍රමාණය හා පාඩු සඳහා හේතු සහ වගකීම් පැවරීමට විමර්ශනයන් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුළු පිරිවැය රු.37,042,983 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 2,477 ක ඌනතාවයක් 2013 වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය විය. කෙසේවුවද පාඩු සඳහා හේතු තීරණය කිරීමට හා වගකීම් පැවරීම සඳහා විමර්ශනයන් සිදුකිරීමට විධිමත් ක්‍රියා මාර්ගයන් ගැනීමෙන් තොරව එම විෂයයන්හි පිරිවැය ගිණුම් පොත්වලින් ලියා හැර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ කටයුතුවලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.600,833,150 ක් සැලකිල්ලට ගැනීමට පෙර රු.756,883,336 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු.577,710,687 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.179,172,649 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. වෙනත් ආදායම රු.2,560,479 කින් වැඩිවීමට ප්‍රතිරූපීව රු.181,733,128 කින් වියදම වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යසාධනය පහත පරිදි වේ.

(අ) උපාධි පාඨමාලා පැවැත්වීම

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ දෙක සඳහා එක් එක් පීඨයන්ට බඳවා ගත් සිසුන් සංඛ්‍යාව හා උපාධි ලබාගැනීමෙන් පසු පිටවී ගිය සිසුන් සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨය | ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව | | | උපාධිය ලබාගත් සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2014 | 2013 | 2012 |
| ව්‍යවහාරික විද්‍යාව | 197 | 243 | 273 | 63 | 33 | 43 |
| කලා හා සංස්කෘතිය | 241 | 418 | 128 | 149 | 134 | 179 |
| කළමනාකරණ හා වාණිජ | 329 | 376 | 354 | 158 | 167 | 106 |
| ඉස්ලාම් හා අරාබි භාෂාව | 340 | 231 | 261 | 145 | 107 | 88 |
| ඉංජිනේරු | 101 | 102 | - | - | - | - |
| එකතුව | 1,208 | 1,370 | 1,016 | 515 | 441 | 416 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ ඉස්ලාම් හා අරාබි භාෂා පීඨය සඳහා සිසුන් බඳවා ගැනීම සියයට 47 කින් වැඩි වී තිබූ අතර ව්‍යවහාර විද්‍යා පීඨය, කළමනාකරණ හා වාණිජ පීඨය සහ කලා හා සංස්කෘතික පීඨයට සමාලෝචිත වර්ෂය තුළ සිසුන් බඳවා ගැනීම පිළිවෙලින් සියයට 19 කින්, සියයට 12.5 කින් හා සියයට 42 කින් අඩු වී තිබුණි.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් පීඨයේ මුළු පිරිවැය හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | ව්‍යවහාර විද්‍යා පීඨය | කලා හා සංස්කෘතික පීඨය | ඉස්ලාම් හා අරාබි භාෂාව පීඨය | කළමනාකරණ හා වාණිජ්‍ය පීඨය | ඉංජිනේරු පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය(රු.000) | 88,474 | 74,407 | 36,624 | 68,956 | 31,683 | 300,144 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 459 | 806 | 744 | 1,024 | 194 | 3,227 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.000) | 193 | 92 | 49 | 67 | 163 | 93 |

ඉහළම ඒක ශිෂ්‍ය පිරිවැය වූ රු.193,000 වාර්තා වී තිබුණේ ව්‍යවහාර විද්‍යා පීඨයෙන් වූ අතර රු.49,000 ක් වූ අඩුම ඒක ශිෂ්‍ය පිරිවැය ඉස්ලාම් හා අරාබි භාෂා පීඨයෙන් වාර්තා විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**-----------------------------------**

පහත සඳහන් අකාර්යක්ෂමතා විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(අ) බැඳුම්කරයේ වලංගු කාලය 2010 ජනවාරි 10 දින ඉකුත් වී තිබුණද, ගිවිසුම කඩ කළ කථිකාචාර්යවරයකුගෙන් රු.8,942,758 ක මුදලක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විශ්වවිද්‍යාලය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම කරුණ 2013 වර්ෂය සඳහා මා විසින් නිකුත් කරන ලද විගණන වාර්තාවේද පෙන්වා දී තිබුණි.

(ආ) 2010 ජනවාරි 22 සිට සිය තනතුර හැර ගිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුගෙන් රු. 1,581,737 ක මුදලක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් එම හිඟ හිටි ශේෂය ඇපකරුගෙන් අයකර ගැනීමට හෝ ඔහුට එරෙහිව නීතිමය පියවර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන්ද පෙන්වා දී තිබුණි.

(ඇ) 2004 වර්ෂය තුළ කථිකාචාර්යවරයකු විසින් ඔහුගේ ගිවිසුම කඩකිරීම හේතුවෙන් බැඳුම්කර වටිනාකම ලෙස 2014 වර්ෂය අවසානයට රු.1,686,896 ක මුදලක් අයකර ගත යුතු විය. කෙසේ වුවද, විශ්වවිද්‍යාලය විසින් වර්ෂ 09 ක ප්‍රමාදයකින් පසු 2013 වර්ෂයේදී මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර තිබුණි. එබැවින් අදාළ කථිකාචාර්යවරයා විසින් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණු අතර ඔහු ශ්‍රී ලංකාවට පැමිණ වර්ෂ 6 කට වැඩි කාලයක් ප්‍රමාද වීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් අයකර ගැනීම් සිදු කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ඔහුගෙන් අයකර ගන්නා ලද සියලු මුදල් ආපසු ගෙවීමට අධිකරණය විසින් තීන්දුවක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් අදාළ කථිකාචාර්යවරයාට ලිපියක් නිකුත් කිරීම ප්‍රමාද වීම සඳහා වගකිව යුතු නිලධාරියාට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අයකර ගැනීම් සඳහා වගකිව යුතු නිලධාරියාගේ නොසැලකිලිමත්කම හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු.1,731,146 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඈ) සුහසාධන ආපනශාලාවේ උපයෝජනය සඳහා 2013 වර්ෂය තුළදී රු.474,400 කට විශ්වවිද්‍යාලය විසින් හොට් කබඩ් (Hot Cupboard) හා චෙස්ට් ෆ්‍රීෂර් (Chest Freezer) මිලදී ගෙන තිබූ අතර මෙම විෂයයන් ඉතා හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද 2015 අප්‍රේල් 30 විගණන දිනය දක්වා මෙම විෂයයන් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා නොගෙන සුහසාධන ආපන ශාලාවේ නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) 1992 ජනවාරි 02 දිනැති අංක 503 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයින් හා ශිෂ්‍ය උපදේශකයින් පිළිවෙලින් රු.500 ක හා රු.300 ක මාසික ගරු දීමනාවකට හිමිකම් ලබයි. කෙසේ වුවද, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයින් හා ශිෂ්‍ය උපදේශකයින් සඳහා ගරු දීමනා ලෙස මූලික වැටුපෙන් පිළිවෙලින් සියයට 15 ක් හා සියයට 10 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයින් දෙදෙනෙකුට හා ශිෂ්‍ය උපදේශකයින් නව දෙනෙකුට ගරු දීමනා ලෙස රු.430,907 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා මෙට්ට මිලදී ගැනීම
-----------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ රු.3,140,000 ක මුළු පිරිවැයකට මෙට්ට 800 ක් විශ්වවිද්‍යාලය විසින් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, විශ්වවිද්‍යාලය විසින් මෙට්ට මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට "යෙලෝ පේජස්" භාවිතා කර තිබුණි. කෙසේ

වුවද “යෙලෝ පේජස්” හි නම ඇතුළත් නොවූ සැපයුම්කරුවකු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ ඉල්ලීම මත තෝරා ගෙන තිබුණි.

(ii) අඩු මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරුවන් 4 දෙනෙකු කිසිදු වලංගු හේතුවක් නොදක්වා විශ්වවිද්‍යාලය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. මේ අතර ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවකුට විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුවන්ට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළේ නම් මෙම මිලදී ගැනීමෙන් රු.1,064,864 ක මුදලක් විශ්වවිද්‍යාලයට ඉතිරි කරගත හැකිව තිබුණි.

(iii) මෙට්ට මිලදී ගැනීම සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරු “ස්පොන්ජ් ෂීට්” (sponge sheet) නිෂ්පාදකයකු හා බෙදාහරින්නකු මිස මෙට්ට නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු නොවීය.

(iv) තෝරාගත් සැපයුම්කරුගෙන් මිලදී ගත් මෙට්ටවල ප්‍රමාණය ඇඳන්වල ප්‍රමාණයට වඩා අඩු වී තිබුණි. එබැවින් ඉල්ලීම් කළ ප්‍රමාණයට මෙට්ටවල දිග ප්‍රමාණය එකතු කිරීම සඳහා රු.180,000 ක අතිරේක පිරිවැයක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදු වී තිබුණි.

(v) මෙට්ටවල ගුණාත්මක තත්ත්වය හා කල් පැවැත්ම පිළිබඳ සැලකිල්ලක් නොදක්වා මෙට්ට මිලදී ගැනීමට විශ්වවිද්‍යාලය විසින් විශාල මුදලක් වැය කර තිබුණි. සැපයුම්කරු විසින් මෙට්ට සඳහා යොදාගෙන තිබූ අමුද්‍රව්‍යවල තත්ත්වය මෙට්ට භාවිතය සඳහා සුදුසු නොවන හෙයින් අනාගතයේදී සිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වයට බලපෑමක් සිදුවිය හැකි බවද නිරීක්ෂණය විය.

(උ) ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය හා ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම සඳහා ගරු දීමනා ගෙවීම

---------------------------------------------------------------------------------------------

ඉහත ලේඛන පිළියෙල කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට හා පාලක සභා සාමාජිකයන් 03 දෙනෙකුට ගරු දීමනා ලෙස රු.1,356,000 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉන්වෙන්ට්‍රි ලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය හා මුදල් අංශයට අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ රාජකාරීන් හි කොටසක් වන නමුත්, කාර්යාල වේලාව තුළ එම ලේඛන පිළියෙල කිරීම සඳහා පරිපාලන හා මුදල් අංශයේ නිලධාරීන් 10 දෙනෙකුට රු.756,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) එම ලේඛන පිළියෙල කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ උපකුලපති හා ලේඛකාධිකාරිගේ කිසිදු සහභාගීත්වයක් නොමැති වුවද කිසිදු වලංගු හේතුවක් නොදක්වා එකතුව රු.300,000 ක මුදලක් ගරු දීමනා ලෙස ඔවුන් විසින් ලබාගෙන තිබුණි.

(ඌ) බාහිර උපාධි හා වෘත්තීය ඉගැන්වීම් මධ්‍යස්ථානයේ කාර්යයන් (CEDPL)

----------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 ඔක්තෝබර් 15 දිනැති අංක 932 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, බාහිර උපාධි හා වෘත්තීය ඉගැන්වීම් සඳහා මධ්‍යස්ථානයේ (CEDPL) කළමනාකරණ කමිටුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද සාමාජිකයකු ඇතුළත්ව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද

සාමාජිකයකු නොමැතිව එම මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් සමන්විත වී තිබුණි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟත්වය නොමැතිව එක් එක් සාමාජිකයාට එක් රැස්වීමකට රු.2,000 බැගින් එකතුව රු.50,000 ක් ගෙවීමට අමතර වශයෙන් බාහිර උපාධි හා වෘත්තිය ඉගැන්වීම් මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් 07 දෙනාට මාසික පදනම මත එකතුව රු.654,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගරු දීමනා ලෙස ගෙවා තිබුණි.

(iii) 2013 වර්ෂයේදී බාහිර උපාධි හා වෘත්තීය ඉගැන්වීම් මධ්‍යස්ථානයේ පරිගණක විද්‍යාගාරය සඳහා රු.2,817,200 ක් වටිනා පරිගණක 24 ක් විශ්වවිද්‍යාලය විසින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද එම පරිගණක 24 න් පරිගණක 14 ක් විශ්වවිද්‍යාලයේ අනෙකුත් අංශ වෙත බෙදාහැර තිබූ අතර පරිගණක විද්‍යාගාරයට කිසිදු පරිගණකයක් නිකුත් කිරීමෙන් තොරව ඉතිරි පරිගණක 10 විගණන දිනය වූ 2015 අප්‍රේල් 30 දක්වාම නිෂ්කාර්යව ගබඩාවේ පැවතුණි.

(එ) ගොඩනැගිල්ලක් සඳහා බදුකුලී ගෙවීම

---------------------------------------------

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් නවාතැන් පහසුකම් සැපයීම සඳහා 2014 ජුනි 06 දින සිට මාස 18 ක කාලපරිච්ඡේදයක් සඳහා රු.120,000 ක මාසික කුලියක් මත ගල්කිස්ස පිහිටි ගොඩනැගිල්ලක් විශ්වවිද්‍යාලය විසින් ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 835 ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව බදුකරු සමඟ එළඹි බදු ගිවිසුම අනුව රු.120,000 ක මාසික බද්දකට එළඹ තිබුණි.

(ii) 2014 ජුනි 06 දින බදු ගිවිසුම අත්සන් කර තිබුණි. කෙසේ වුවද ගිවිසුම අත්සන් කළ දිනයේදී රු.2,160,000 ක් වූ සම්පූර්ණ බදු මුදල අත්තිකාරමක් ලෙස බදුකරුට ගෙවා තිබුණි.

(iii) 2014 ජුනි 06 දින බදු ගිවිසුම අත්සන් කර තිබුණද, ලියකියවිලි ලියාපදිංචි කිරීමේ ආඥපනතේ 135 පරිච්ඡේදයේ 17 වගන්තිය යටතේ මෙම බදු ගිවිසුම ඉඩම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කර නොතිබුණි.

**4.3** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලය විසින් එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ උපන්දිනය සැමරීම සඳහා 2014 නොවැම්බර් 19 දින පුවත්පත්වල සුභපැතුම් පළ කර තිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල අරමුදලින් රු.221,200 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) එවකට ජනාධිපතිවරයා පිළිගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද උත්සවයට යොදාගැනීමේ අදහසින් 2014 අප්‍රේල් 21 දින රු.1,099,240 කට විශ්වවිද්‍යාලය විසින් රතු පලසක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද එය අරමුණු කළ කාර්යය සඳහා යොදා ගෙන නොතිබූ අතර 2015 අප්‍රේල් 30 විගණන දිනය දක්වාම එය නිෂ්කාර්යව පැවතුණි.

(iii) එවකට ජනාධිපතිවරයා හා අමාත්‍යවරුන් පිළිගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද උත්සවය සඳහා රු.1,016,935 ක් වූ සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය විසින් වැය කර තිබුණි. කෙසේ වුවද උත්සවය සඳහා සහභාගී වූ පුද්ගලයන් සංඛ්‍යාව, අයවැයගත ඇස්තමේන්තු ආදී අවශ්‍ය තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම වියදම විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**4.4.1 රසායනික උපකරණ මිලදී ගැනීම**

ව්‍යවහාර විද්‍යා පීඨයේ රසායනික උපකරණ ලෙස භාවිතා කිරීම සඳහා පෝටබල් ලීෆ් ඒරියා මීටරයක් (Portable Leaf Area Meter) මිලදී ගැනීමට විශ්වවිද්‍යාලය විසින් සැපයුම්කරුවන් 6 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවා තිබුණු අතර අඩුම මිල සැඳහුම රු.1,064,000 ක් විය. කෙසේ වුවද අඩුම මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට වලංගු හේතූන් නොදක්වා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් රු.2,183,500 ක ඉහළම මිල සැඳහුම නිර්දේශ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම උපකරණය මිලදී ගැනීමෙන් විශ්වවිද්‍යාලයට රු.1,119,500 ක පාඩුවක් සිදු වී තිබුණි.

**4.4.2 අභ්‍යන්තර මාර්ගය වැඩිදියුණු කිරීම**

ප්‍රධාන මාර්ගයේ සිට විශ්වවිද්‍යාලයේ ආරක්ෂක ස්ථාන අංක 07 දක්වා අභ්‍යන්තර මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් වටිනාකම රු.43,675,676 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂය තුළ නැගෙනහිර පළාතේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.10,944,641 ක් වැය කරමින් ඉහත සඳහන් මාර්ගය ඉදිකර තිබුණි. කෙසේ වුවද කිසිදු අවශ්‍යතාවයකින් තොරව එම කොන්ත්‍රාත්තුව විශ්වවිද්‍යාලය විසින් රු.43,675,676 ක කොන්ත්‍රාත් මිලකට 2014 වර්ෂයේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට නැවත පිරිනමා තිබුණි.

(ආ) ප්‍රධාන මාර්ගයේ සිට විශ්වවිද්‍යාලයේ ආරක්ෂක ස්ථානය දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙනත් මාර්ග කොන්ත්‍රාත්තුවක් එම කාල පරිච්ඡේදය තුළදීම විශ්වවිද්‍යාලය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පිරිනමා තිබුණි. කෙසේ වුවද ඉහත සඳහන් මාර්ග දෙක සඳහා ප්‍රවාහනය සමඟ ඒබීසී (Aggregate base course) සැපයීම හා එළීමට අදාළ එකම වැඩ විෂයයන් සඳහා වෙනස් රේටයන් දෙකක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් යොදා ගෙන තිබුණි. ඒ අනුව, ප්‍රධාන මාර්ගයේ සිට ආරක්ෂක ස්ථානය දක්වා අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු.380,256 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ආරක්ෂක ස්ථානය දක්වා අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 2014 වර්ෂයේදී නිම කර තිබූ අතර, රු.43,675,676 ක් වූ සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කරන ලද අතිරේක වැඩ සඳහා රු.7,418,160 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබුණි. ප්‍රසම්පාදන කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එම අතිරේක වැඩ සඳහා විශ්වවිද්‍යාලය විසින් ගෙවීම් කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, 2014 ජුනි 30 ට පෙර ඉදිකිරීම් වැඩ නිම කළ යුතු විය. කෙසේ වුවද එය නිමකර තිබුණේ 2014 ජුලි 31 දිනදීය. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගෙන් රු.592,585 ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස අය කර නොතිබුණි.

### 4.4.3 ව්‍යවහාර විද්‍යා පීඨයේ ශිෂ්‍ය නේවාසිකාගාරය හා සේවක නිල නිවාස ඉදිකිරීම

------------------------------------------------------------------------------------

ශිෂ්‍ය නේවාසිකාගාරය හා සේවක නිල නිවාස ඉදිකිරීම සඳහා රු.92,508,979 ක කොන්ත්‍රාත් වටිනාකමට 2011 නොවැම්බර් 01 දින විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම ප්‍රදේශයේ නවාතැන් පහසුකම් සොයාගැනීමේ දැඩි දුෂ්කරතාවන්ට ශිෂ්‍යයින් මුහුණ දෙන හෙයින් මෙම නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමට විශ්වවිද්‍යාලය ප්‍රමුඛත්වය ලබා දී තිබුණි. එබැවින් වර්ෂ දෙකක කාලයක් ඇතුළත මෙම ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ නිම කිරීම සඳහා අනුමැතිය අමාත්‍ය මණ්ඩලය විසින්ද ලබා දී තිබුණි. කෙසේ වුවද කිසිදු වලංගු හේතුවක් නොමැතිව හා කොන්ත්‍රාත්කරුට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව 2014 අගෝස්තු 31 දක්වා අවස්ථා 5 කදී විශ්වවිද්‍යාලය විසින් දීර්ඝ කිරීම් ලබා දී තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 17 ට හෝ ඊට පෙර ඉදිකිරීම් වැඩ නිම කළ යුතු වුවද 2014 අගෝස්තු 31 දක්වා පස්වෙනි දීර්ඝ කිරීම ලබාදීමෙන් පසුවද සියයට 60 ක වැඩ පමණක් නිම කර තිබුණි. තවද විශ්වවිද්‍යාලය විසින් වැඩ නිම කිරීමට නියමිත දිනයට පසුවද මිල ඉහළයාම් සඳහා කොන්ත්‍රාත්කරුට රු.7,091,312 ක මුදලක් මිල ඉහළයාම් ලෙස ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය හා කොන්ත්‍රාත්කරු අතර එළඹි කොන්ත්‍රාත් ගිවිසුම අනුව, කොන්ත්‍රාත්කරුට බිල් ගෙවීමේ ප්‍රමාදය සඳහා දඩ මුදල් ගෙවීමට අදාළව ගිවිසුමේ කිසිදු කොන්දේසියක් ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් ප්‍රමාද වූ ගෙවීම් සඳහා රු.1,206,460 ක් දඩ මුදල් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, ප්‍රමාද ගාස්තු ආරම්භක කොන්ත්‍රාත් මිලෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව ආරම්භක කොන්ත්‍රාත් මිලෙන් දිනකට සියයට 0.05 ක් බැගින් අයකළ යුතුය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුගෙන් රු.9,158,389 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ලබා දී තිබූ වලංගු නොවන හේතු සඳහා විශ්වවිද්‍යාලය විසින් ලබා දී තිබූ කාලය දීර්ඝ කිරීම් සැලකිල්ලට ගැනීමෙන් තොරව නිම කිරීම සඳහා නියමිත වූ දිනයේ සිට ප්‍රමාද ගාස්තු ගණනය කළේ නම් ප්‍රමාද ගාස්තු ප්‍රමාණය රු.39,964,320 ක් විය යුතුව තිබුණි.

(ඉ) කොන්ත්‍රාත්කරුගේ ධාරිතාවය හා පෙර පළපුරුද්ද විධිමත්ව ඇගයීම් කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සිදු කර තිබූ බැවින් වැඩ නිම කිරීමට නියමිත දින සිට වර්ෂ 3 ක් ඉකුත් වීමෙන් පසුවද ඉදිකිරීම් වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වී තිබුණි. එබැවින් 2013 හා 2014 වර්ෂවල විශ්වවිද්‍යාල සිසුන්ට නවාතැන් පහසුකම් සැලසීම වෙනුවෙන් කුලියට ගන්නා ලද ගොඩනැගිලි සඳහා කුලී ගෙවීම් ලෙස රු.4,929,250 ක මුදලක් ගෙවීමට විශ්වවිද්‍යාලයට සිදු වී තිබුණි.

### 4.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍යාධිකාරී තනතුර 2013 දෙසැම්බර් 15 සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද මෙම තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට විශ්ව විද්‍යාලය විසින් 2015 අප්‍රේල් 30 දින වන විටත් ඵලදායී පියවරක් ගෙන නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂ කිහිපයක් සඳහා පීඨ කිහිපයක මහාචාර්ය හා ආශ්‍රිත මහාචාර්ය තනතුරුවල පැවති පුරප්පාඩු 8 ක් පිරවීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. මෙම තත්ත්වය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අයහපත් ලෙස බලපා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 1997 නොවැම්බර් 21 දිනැති අංක 721 දරන චක්‍රලේඛය අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීම් විවෘත දැන්වීම් මඟින් සිදු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට පටහැනිව තාවකාලික සහකාර කථිකාචාර්යවරුන් ලෙස සේවය කළ නිලධාරීන් 09 දෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ලෙස උසස් කර තිබුණි.

**5 පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) ණය හා අත්තිකාරම් අයකර ගැනීම
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය